**ජාතික මාර්ග ජාලයේ ප්‍රධාන පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතියේ (ප්‍රධාන පාලම් 37 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය-ජැයිකා) - 2020**

---

**ජාතික මාර්ග ජාලයේ ප්‍රධාන පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතියේ (ප්‍රධාන පාලම් 37 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය-ජැයිකා) 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය අතර 2013 මාර්තු 14 දින එළඹි අංක එස්එල්-පී 108 දරන ණය ගිවිසුමේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකනු ලබන මාගේ අදහස් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.**

**1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

---

**ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට වරාය හා මහාමාර්ග අමාත්‍යාංශය වර්තමානයේ මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ජාතික මාර්ගවල ප්‍රධාන පාලම් ඉදිකිරීම මඟින් ජාතික මාර්ග ජාලය වැඩි දියුණු කිරීම හා එමඟින් ආර්ථික සංවර්ධනයට දායක වීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 27,250කට සමාන ජපන් යෙන් මිලියන 16,132ක් වන අතර ඉන් රු.මිලියන 20,914කට සමාන ජපන් යෙන් මිලියන 12,381 ක් සැපයීමට ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය එකඟ වී තිබුණි. ජපන් යෙන් මිලියන 3,751ක් වන ඉතිරි මුදල මූල්‍යයනය කිරීමට ශ්‍රී ලංකා රජය විසින් එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2013 මාර්තු මස ආරම්භ කළ අතර 2019 වර්ෂයේදී අවසන් කිරීමට නියමිත විය. ණය උපයෝජනයේ කල්ඉකුත්වීම 2021 ජූනි 05 දින අවසන් කිරීමට නියමිත වූ අතර ණය දීර්ඝ කිරීම් ලබා දීමට ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය අපේක්ෂා නොකරයි. ප්‍රතිඵලයක් ලෙස, මුළු ණය වටිනාකමින් සියයට 37 ක් හෙවත් එකතුව රු.මිලියන 7,760කට සමාන ජපන් යෙන් මිලියන 4,595ක් ව්‍යාපෘතියේ විෂය පථයේ ඉතිරි වැඩ සඳහා භාවිතයට ගැනීමට නොහැකි වේ.**

**1.3 මතය**

---

**ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.**

**1.4 මතය සඳහා පදනම**

---

**ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.**

**1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම**

---

**මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන් වලට අනුකූලව පිළියෙල කිරීම, සත්‍ය හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.**
**ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම පිළිබඳව වගකීම ඊට සම්බන්ධ පාර්ශවය විසින් දරනු ලබයි.**

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීම සම්බන්ධව විගණකගේ වගකීම

-------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හෝ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත්කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී ඒ සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හෝ වැරදි තනිව හෝ සාමුහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය හා වෘත්තීය සැකයෙන් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාචෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් හා ක්‍රියාත්මක කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ යෝග්‍ය විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනානොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාචෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම් වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනයේදී මා හඳුනාගන්නා අභ්‍යන්තර පාලනයේ සැලකිය යුතු අඩුපාඩුද ඇතුළුව සැලකිය යුතු විගණන සොයාගැනීම් හා අනෙකුත් කරුණු සම්බන්ධයෙන් ඊට සම්බන්ධ පාර්ශවයන් සමඟ මම සන්නිවේදනය කරමි.

## 2. නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම

| | නීති, රීති රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | 2019 මාර්තු 15 දිනැති අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 3.2.2 වගන්තිය | චක්‍රලේඛයේ ප්‍රතිපාදනවලට පටහැනිව, ව්‍යාපෘතිය විසින් වැරදි වැටුප් පියවර ලබාදීම හේතුවෙන් රු. මිලියන 1.4ක වැඩිපුර වැටුප් මුදලක් නිලධාරීන් දෙදෙනෙකුට ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවීමක් සිදු කර නොතිබුණි. | 2019 මාර්තු 15 දිනැති අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය පදනම් කර ගනිමින් ව්‍යාපෘතියේ කාර්ය මණ්ඩලයේ වැටුප් ගණනය කළ යුතුය. |
| (ආ)) | 2019 මාර්තු 15 දිනැති අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 3.2.3 වගන්තිය සහ 2016 පෙබරවාරි 25 දිනැති 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | චක්‍රලේඛයට පටහැනිව, ව්‍යාපෘතිය 2021 ජූලි 31 දිනට සියයට 50 දීමනා සේවා අර්ථසාධක අරමුදල සහ සේවා භාරකාර අරමුදල ඇතුළුව SPMUහි ව්‍යාපෘති කාර්ය මණ්ඩලයේ තිදෙනෙකුට රු. මිලියන 1.9ක් වැඩිපුර ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවීමක් සිදු කර නොතිබුණි. | වගුව 01හි සඳහන් නොවන ව්‍යාපෘති කාර්ය මණ්ඩලයේ තනතුරු සඳහා වැටුප්, අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ සමාන තනතුරුවල බඳවා ගැනීමේදී ආරම්භක වැටුප් පරිමාණය මත පදනම් විය යුතුය. |

## 3.1 කොන්ත්‍රාත් පරිපාලනය

| | විගණන ගැටලු | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | 2013 ජූනි 05 දින සිට ණය ගිවිසුම බලාත්මක වුවද, 2020 දෙසැම්බර් 31 දිනට පාලම් ඉදිකිරීමේ කටයුතුවල ප්‍රමාදයන් හේතුවෙන්, ජපන් යෙන් මිලියන 12,381න්, මුළු ණය මුදලින් සියයට 37 හෙවත් ජපන් යෙන් මිලියන 4,586ක් උපයෝජනය කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, එකතුව රු. මිලියන 84ක් බැදීම් ගාස්තු ලෙස ගෙවා තිබුණි. තවද, ව්‍යාපෘතිය 2020 ජූනි 05 සිට 2021 ජූලි 05 දක්වා ණය මුදලින් කිසිදු මුදලක් ලබා ගෙන නොතිබුණි. කෙසේවෙතත්, බැදීම් ගාස්තු ලෙස රු. මිලියන 04ක් ගෙවා තිබුණි. | පැකේජ 03 සමග කටයුතු කිරීමට JICA ආයතනය එකඟතාවය ලබාදී නොතිබුණු අතර, අවසානයේදී 2020 ජූලි 02 දින ණය ගිවිසුම අවසාන කිරීමට තීරණය විය. | ණය කාලසීමාව තුළ වැඩ විෂය පථය නිම කිරීමේ අරමුණින් පාලම් ඉදිකිරීමේ කටයුතු නිසි පරිදි සැලසුම් කිරීම අවශ්‍ය වේ. |
| (ආ) | 2013 වර්ෂයේදී පාලම් නිර්මාණය සහ අධීක්ෂණය සඳහා උපදේශන සේවාව ආරම්භ වූ අතර 2015 වන විට පාලම් 37 ක නිර්මාණ කටයුතු උපදේශක විසින් නිම කර තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘතිය මුළු | MBCP මගින් කරන ලද ඉතිරි පාලම් 19 නිර්මාණ වෙනත් ව්‍යාපෘතියක් යටතේ ඉදිකිරීමට මාර්ග සංවර්ධන අධිකාරිය යොදා ගනු ලැබේ. | අලාභය අවම කර ගැනීමට අනාගත පාලම් ඉදිකිරීම්වලදී ඉතිරි පාලම් නිර්මාණ යොදා ගැනීමට පියවර |

| | | |
|---|---|---|
| නිර්මාණවලින්, ණය කාලසීමාව අවසාන වන විට කොන්ත්‍රාත් පැකේජ **2** යටතේ නව පාලම් **18** ක් ඉදිකිරීම සඳහා පාලම් **18**ක නිර්මාණ පමණක් යොදාගෙන තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, පාලම් **19**ක් නිර්මාණය සඳහා ව්‍යාපෘතිය විසින් ආසන්න වශයෙන් දරන ලද රු.මිලියන **275**ක පිරිවැය නිශ්කාර්ය වියදමක් බවට පත් වී තිබුණි. | | ගැනීම අවශ්‍ය වේ. |

**3.2 ඉඩම් අත්පත්කර ගැනීම පිළිබඳ ගැටලු**

| විගණන ගැටලුව | කළමනාකාරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| ලබා දී ඇති තොරතුරු අනුව, කොන්ත්‍රාත් පැකේජ **3** යටතේ පාලම් **22**ක් ඉදිකිරීම සඳහා රජයේ ඉඩම් කොටස් **172**ක් ඇතුළුව ඉඩම් කොටස් **395**ක් අත්පත් කර ගැනීමට සැලසුම් කර තිබුණු අතර **2020** දෙසැම්බර් **31** දින දක්වා ඉඩම් කොටස් **121**ක් සඳහා රු. මිලියන **337**ක වන්දි මුදලක් ගෙවා තිබුණි. ඊට අමතරව, සමාලෝචිත වර්ෂය අවසානය වන විට වන්දි ගෙවීම ප්‍රමාදවීම මත පොළිය ලෙස රු. මිලියන **41**ක් වැය කර තිබුණි. කෙසේවෙතත්, සමාලෝචිත වර්ෂය අවසානය වන විට ඉඩම් අත්පත් කරගැනීමේ පනතේ **44**වන වගන්තිය යටතේ ඉඩම් කොටස් **36**ක් පමණක් ලියාපදිංචි කර තිබුණි. තවද, ප්‍රමාණවත් මූල්‍ය පහසුකම් නොමැතිවීම හේතුවෙන් කොන්ත්‍රාත් පැකේජ **3**හි ඉඩම් අත්පත් කර ගැනීමේ සඳහා ව්‍යාපෘතිය විසින් එකතුව රු.මිලියන **34**ක් දරා තිබුණද කටයුතු ආරම්භ කර නොතිබුණි. | අත්පත් කර ගත් ඉඩම් කොටස් අදාළ ප්‍රාදේශීය ලේකම්වරු සමග ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ **44** වන වගන්තිය යටතේ ලියාපදිංචි සිදු කරමින් පවතී. කෙසේවෙනත්, පවතින කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් මෙම ක්‍රියාවලිය ප්‍රමාද වී ඇත. | ඉතිරි ඉඩම් අත්පත් කර ගැනීම් සම්පූර්ණ කිරීමට පියවර ගත යුතුය. ඊට අමතරව වන්දි ගෙවීම් පිළිබඳව ප්‍රමාණවත් සැලසුම් කිරීමක්, ප්‍රගතිය සමාලෝචනයක් අධීක්ෂණයක් සහ පාලනයක් සිදු කිරීම අවශ්‍ය වේ. |